**ශීර්ෂය 320 - සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශනය සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශනයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

**1.2 ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම**

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 124 රෙගුලාසිය ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට ආදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන විෂය පථය**

---

ශිර්ෂය 320 - සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනිම, නීති,රීතී හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව ඉදිරි දින වලදී සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත නිකුත් කරනු ලැබේ. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන

හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගණුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

----------------------

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වනු ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.9 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබුණු බව නිරීක්ෂණය විය.

| මුදල් රෙගුලාසි 128(1) ප්‍රකාර ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය | | ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම | නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|---|
| **මුදල් රෙගුලාසි** | | | |
| 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දී මෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලැකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනිමට පරිශ්‍රමයක් දක්වා තිබිම. | 1. ප්‍රධාන කාර්යයන්ට පටහැනි කාර්යයන් | 2.1.1 |
| | | 2. අයවැය ඇස්තමේන්තු තාත්ත්වික ලෙස පිළියෙල නොකිරීම. | 2.6 |
| 128(1)(ආ) | තම දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය හා ගිණුම්කරණය සඳහා සංවිධානය සාර්ථක බවට සහ අවශ්‍ය අවස්ථාවලදී රජයට ලැබිය යුතු ගාස්තු නිවැරදිව නිශ්චය කිරීමට ඒවා ක්‍රමානුකූලවද සම්පූර්ණයෙන්ම ද අප්‍රමාදව ද එකතු කර ගැනිමට සහ ලැබෙන මුදල් ගිණුම්ගත කිරීමටද, රජය වෙනුවෙන් වගකීම්වලට බැඳීම් සඳහා බලය දීමටද ඉටුකරන ලද සේවාවන් සැපයිම් අධීක්ෂණය හා පරීක්ෂා කිරිමට සහ එම රජයේ අර | 1. ප්‍රධාන කාර්යයන්ට පටහැනි කාර්යයන් | 2.1.1 |
| | | 2. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.3.1 (අ),ආ) |
| | | 3. මහජනයා සඳහා සේවා ඉටුකිරීමේ අඩුපාඩු | 2.1.2 (අ) |

| | | | |
|---|---|---|---|
| | මුදලින් ඒ සඳහා අප්‍රමාදව හා නිවැරදිව ගෙවීම් කිරීමට ඉන් ප්‍රමාණවත් තරම් විධිවිධාන සලසා තිබීම. | | |
| 128(1)(ඇ) | ලැබීම්, ගෙවීම් හා නිකුත් කිරීම් සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර සෝදිසි ක්‍රමයක් පවත්වා ගෙන යන බවට හා ඒ ක්‍රමයේ ක්‍රියාකාරීත්වය කලින් කල සෝදිසි කරන බව | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.7 |
| 128(1)(ඈ) | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා හෝ භාණ්ඩාගාරය හෝ විසින් ඉල්ලා සිටින තොරතුරු, ප්‍රකාශ හා වාර්තා නිවැරදිව කලට වේලාවට ඉදිරිපත් කරන බව | වාර්ෂික කාර්යසාධන වාර්තාව ප්‍රමාද වී ඉදිරිපත් කිරීම | 2.1.3 |
| 128(1)(උ) | රජයට ලැබිය යුතු මුදල් එකතු කිරිම පිළිබඳ ප්‍රගතිය දැක්වෙන වාර්තා නිතිපතා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට යවන බව | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම සම්බන්ධයෙන් වූ අඩුපාඩු | 2.7 |
| 128(1)(ඌ) | හිඟව තිබෙන ගාස්තු යනාදිය අයකර ගැනිමට විශේෂ විධිවිධාන යොදන බවට සහ එම කාර්ය පැවැරී ඇති නිලධාරීන් විසින් හිඟ මුදල් පිළිබඳව ඒවා අයකර ගැනීම කඩිනම් කිරීමට ගනු ලැබූ පියවර පිළිබඳව යටත් පිරිසෙන් තුන් මාසයකට වරක් හෝ අන්‍යාකාරයකින් විධානය කළ පරිදි හෝ තමා වෙත වාර්තා කරන බව | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ හිඟහිටි ණය ශේෂ අයකර ගැනීම | 2.7 |

| | | | |
|---|---|---|---|
| 128(1)(ඵ) | රජයේ කටයුතු ඉටු කිරීමේදී අපේක්ෂිත අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව, විධිමත්බව හා අවංකභාවය යන කරුණු පිළිබඳ නිසි සැලැකිල්ලෙන් යුක්තව තම දෙපාර්තමේන්තුවේ කටයුතු කරගෙන යන බව (මෙහිලා අරපිරිමැස්ම යනුවෙන් අදහස් කෙරෙන්නේ හුදෙක් ඇස්තමේන්තුමත වියදම් දැරීම නොව, වියදම් කරනු ලබන මුදල දරනා රජයට උපරිම වටිනාකම ලැබෙන බවට සහතික කිරීම) | 1. අවිධිමත් ගනුදෙනු<br>2. අනාර්ථික ගනුදෙනු | 2.4 (අ) (ආ)<br>2.5 |
| 128(1)(ක) | ගණන්දීමේ නිලධාරියා වශයෙන් තමා වගකීමට බැඳී සිටින වියදම් ශීර්ෂයක එක් එක් වැඩසටහන වෙනුවෙන් මුදල් වර්ෂය අවසානයේදී විසර්ජන ගිණුමක් ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත ඉදිරිපත් කරනු ලබන බව (මු.රෙ.150 බලන්න) | විසර්ජන ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.6 (අ) |

**2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**2.1 කාර්යසාධනය**

**2.1.1 ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්**

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව සතු භෞතික සම්පත්, මානව සම්පත් සහ අභ්‍යන්තර අරමුදල් උපයෝගී කරගනිමින් බලකායන් 22 ක් සහ පුහුණු පාසල් 05 ක් මගින් විවිධ ස්වරූපයේ ව්‍යාපෘති ආරම්භ කර පවත්වාගෙන යන නමුත් දෙපාර්තමේන්තුව තම දැක්ම,මෙහෙවර හා කාර්යයන් යටතේ එවැනි ව්‍යාපෘති පවත්වා ගෙන යාම ආයතනයේ අරමුණු වශයෙන් හඳුනාගෙන නොතිබුණි.

## 2.1.2 අපේක්ෂිත නිමවුම් මට්ටම් ලබා නොගැනීම

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව ආරක්ෂක භටයින් 31,981 ක් හා කාන්තා නිලධාරීන් 5,163 කින් සමන්විත වූ අතර, සමාලෝචිත වර්ෂය තුළදී මෙම බලකායන්හි නිලධාරීන් 15,903 දෙනෙකු යොදවා ආදායම් ජනනය කල හැකි විවිධ ව්‍යාපෘති 1,589 ක් දිවයින පුරා ක්‍රියාත්මක කර තිබුණි. මේ සම්බන්ධයෙන් කල නියැදි විගණන පරීක්ෂණවලදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) වල් අලි තර්ජනයට ලක්වන ගම්මාන/ප්‍රදේශවල අලි මිනිස් ගැටුම අවම කිරීමේ අරමුණින් වනජීවී දෙපාර්තමේන්තුව විසින් ඉදිකරන ලද විදුලි වැට (අලි වැට) නඩත්තු කටයුතු හා අධීක්ෂණ කටයුතු සඳහා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ භටයින්ගේ සහය ලබාගෙන තිබුණි. ඒ අනුව කටුනායක බලකාය විසින් වයඹ පළාතේ ප්‍රදේශ 12 ක් ආවරණය වන පරිදි කි.මී. 252 ක දුර විදුලි වැට නඩත්තු කටයුතු සහ අධීක්ෂණ කටයුතු වෙනුවෙන් භටයින් 79 ක් අනුයුක්ත කර තිබුණි. නමුත් අනුයුක්ත කර තිබුණු සිවිල් ආරක්ෂක භටයින් අදාළ කාර්යයන් නියමාකාරව ඉටු නොකරන බවට 2017 ජුනි හා ජූලි මාසවලදී ඒ ඒ ප්‍රදේශ වල සමිති, සංවිධාන හා පුද්ගලයින් වෙතින් බලකාය වෙත පැමිණිලි ඉදිරිපත් වූ අවස්ථා 06 ක් නිරීක්ෂණය විය.

(ආ) කටුනායක බලකාය යටතේ ක්‍රියාත්මක වූ කදිරාන කෘෂි ව්‍යාපෘතිය තුළ භෝග වර්ග 04 ක් වගාකර තිබුණු අතර, දැඩි නියඟය හේතුවෙන් එම භෝග වගාවන් විනාශ වීමෙන් කිසිදු ආදායමක් උපයා ගැනීමට නොහැකි වී තිබුණි. නමුත් නියඟය හේතුවෙන් එසේ හානි වූ බවට තහවුරු කර ගැනීමට හැකිවන පරිදි කෘෂි පර්යේෂණ සහකාර, ග්‍රාම සේවක යනාදී නිලධාරීන්ගේ වාර්තා යනාදී ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

(ඇ) විල්පත්තු බලකාය මගින් ක්‍රියාත්මක කල කොන්ඩච්චිය කජු වගා ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

(i) ව්‍යාපෘතිය මගින් ලබා ගන්නා කජු අස්වැන්න ගබඩාවලට රැස්කරන අවස්ථාවලදී ප්‍රමාණාත්මකව මිණුම් කර ගබඩා නොකරන අතර, අළෙවි කරන අවස්ථාවේදී මිණුම් කර අළෙවි කර තිබුණි. එසේම ගබඩාවන් තුළ තොග ගබඩා කර පවතින විට සිදුවිය හැකි සාමාන්‍ය අපතය හඳුනාගැනීමටද ක්‍රියා කර නොතිබුණි.

(ii) ව්‍යාපෘතිය යටතේ අක්කර 1,200 ප්‍රමාණයක කජු වගාකර තිබුණු නමුත්, ගස් සම්බන්ධව ජීව දත්ත තොරතුරු ඇතුළත් කර ගස් රෙජිස්ටරයක් පවත්වා ගෙන යාම හෝ තොරතුරු වාර්තා කර පවත්වා ගැනීමට වැඩ පිළිවෙලක් නොපැවතුණි.

(iii) ව්‍යාපෘතියට අනුයුක්ත මාසික සාමාන්‍ය භටයින් 718 දෙනෙකුගේ දෛනික රාජකාරි පැවරීම පිළිබඳ විස්තර නඩත්තු කර නොතිබුණු අතර, භටයින්ගේ දෛනික රාජකාරී ඉටු කිරීම වාර්තා කිරීමේ ක්‍රමවේදයක්ද නොපැවතුණි.

(ඇ) අම්පාර බලකායේ පවත්වා ගෙන යනු ලැබූ වී වගා ව්‍යාපෘතිවලින් අක්කරයකින් සාමාන්‍ය අස්වැන්න ලෙස යල කන්නය සඳහා කි:ග්‍රෑ 945 ක්ද, මහ කන්නයේදී කි:ග්‍රෑ 896 ක්ද ලැබී තිබුණි. කෙසේ වෙතත් මහකන්නයේදී එම ප්‍රදේශයේ පිහිටි සමන්තුරය ව්‍යාපෘති කාර්යාලය මගින් ලබා ගත් වී අස්වනු ප්‍රමාණය කි:ග්‍රෑ 3,050 ක් වූ අතර, එහි අක්කරයකට සාමාන්‍ය අස්වැන්න කි.ග්‍රෑ.435 ක් වූ සැලකිය යුතු පහල අගයක් වී තිබුණි.

(ඉ) මහඔය බලකාය යටතේ වූ වී වගා ව්‍යාපෘති 66 කින් 2016/17 මහ කන්නයේදී අස්වැන්න ලෙස ලබා තිබුණු නාඩු වී, රතු වී, සම්බා වී හා කීරි සම්බා වී ප්‍රමාණ පිළිවෙලින් කි:ග්‍රෑ 417,592, කි:ග්‍රෑ113,270, කි:ග්‍රෑ29,027 සහ කි:ග්‍රෑ15,518 ක් අළෙවි කිරීමට ප්‍රාදේශීය ආයතන 03 කින් මිල ගණන් කැඳවා තෝරා ගත් අළෙවිකරුට සෑම වී වර්ගයක්ම කි:ග්‍රෑ 01 ක් රු.35 බැගින් වන පරිදි අළෙවි කර තිබුණි. නමුත් අනුරාධපුර ප්‍රදේශයේ හොරොව්පතාන බලකාය විසින් වී කි:ග්‍රෑ 01 ක් රු. 52 ක මිලකට තම අස්වැන්න අළෙවි කරගෙන තිබුණු බව නිරීක්ෂණය විය.

(ඊ) සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරණු ලබන ව්‍යාපෘති අතුරින් නියැදි පරීක්ෂණයකින් තෝරාගනු ලැබුණු ගඩොල්, සිමෙන්ති ගල්, පහන්තිර, බටකුඩ නිෂ්පාදනය සහ අන්නාසි වගාව යන ව්‍යාපෘති සම්බන්ධයෙන් සිදුකල විගණන පරීක්ෂණ වලදී අනාවරණය වූයේ මෙම ව්‍යාපෘති වල එක් භටයකුගේ මාසික සාමාන්‍ය දායකත්වය පිළිවෙලින් රු.3,470, රු.2,976, රු. 5,721ක්,රු.5,550 ක් සහ රු. 5,140 ක් වූ බවය.

(උ) කතරගම බලකායේ දෙමළිය කෘෂි ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

(i) කතරගම බලකායේ දෙමළිය කෘෂි ව්‍යාපෘතිය සඳහා 2013 ජුනි 19 දින වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් හෙක්ටයාර් 59.5 ඉඩමක් පරිසර හිතකාමී වගා බිමක් ස්ථාපනය කිරීම සඳහා, ගිවිසුමක් මගින් ලබා ගෙන තිබුණි. ගිවිසුමට අනුව 2016 ජුනි 19 දින ගිවිසුම් කාලය අවසන් වන නමුත් කාලය දීර්ඝකර ගැනීමක් සිදු නොකර 2017 දෙසැම්බර් 31 දින වන තෙක් ව්‍යාපෘතිය අඛණ්ඩව ක්‍රියාත්මක කර තිබුණි.

(ii) එමෙන්ම ව්‍යාපෘතියට අනුයුක්ත කල භටයින් සිදුකලයුතු කාර්යයන් ලිඛිතව පවරා නොතිබුණු අතර, ඒ අනුව භටයින් දෛනිකව ඉටුකල කාර්යයන් පිළිබඳව සාක්ෂි ලබා ගත නොහැකි විය. බලකා මූලස්ථානය හා ව්‍යාපෘතිය අතර දුර කි.මී 60 ක් පමණ වීම හේතුවෙන් මූලස්ථානය මගින් ව්‍යාපෘතිය අධීක්ෂණය කිරීම දුර්වල මට්ටමක පැවති බව නිරීක්ෂණය විය.

**2.1.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කලයුතු වුවත්, එම වාර්තාව 2018 ජූලි 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**2.2 තිරසාර සංවර්ධනය**

**තිරසාර අරමුණු ළඟා කර ගැනීම**

තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් තම විෂයපථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක විය යුතු ආකාරය පිළිබඳව දැනුවත් වී තිබුණි.

(අ) තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 පිළිබඳව දෙපාර්තමේන්තුව විසින් දැනුවත්ව සිය විෂයපථයට අනුව ලඟා කර ගත යුතු තිරසර සංවර්ධන අරමුණු හඳුනා ගෙන තිබුණි.

(ආ) ඒ අනුව දැරිය හැකි පිවිතුරු බලශක්තිය සහ කුසගින්න තුරන් කිරීම යනාදී අරමුණු මත පදනම්ව ඉලක්කයන් හා ඉලක්ක කරා ලඟා විය යුතු සන්ධිස්ථානයන්ද, ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද, හඳුනා ගැනීමට කටයුතු කරනබව දන්වා තිබුණි.

(ඇ) තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව ගැන උනන්දුවක් දක්වන පාර්ශවයන් හඳුනාගෙන තිබුණද, ඔවුන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) දැරිය හැකි පිවිතුරු බලශක්තිය අරමුණ යටතේ වාර්ෂිකව රු. මිලියන 29 ක විදුලි වියදම අඩු කිරීම යන ඉලක්කය පමණක් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ගෙන තිබුණු අතර, කුසගින්න තුරන් කිරීම අරමුණ යටතේ වූ වාරි පද්ධති තුළින් පුරන් කුඹුරු අස්වැද්දීම යන ඉලක්ක ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(ඉ) දෙපාර්තමේන්තුව විසින් හඳුනා ගනු ලැබූ තිරසර සංවර්ධන දර්ශක සඳහා සියළු පාර්ශවයන් නියෝජනය වන පරිදි දත්ත එක්රැස් කිරීමේ ක්‍රමවේදයක් හඳුනා ගෙන නොතිබුණි. නමුත් දත්ත එක්රැස් කිරීමේ කාර්යය සඳහා නිලධාරීන් යෙදවීමට අපේක්ෂා කරන අතර, ඉදිරි වැඩ සටහන් සැලසුම් අදියරේ පවතින බවද දන්වා තිබුණි.

## 2.3 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ලබා ගැනීම

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුව කටයුතු කරමින් සැපයීම් හා සේවා ලබා ගත යුතු වූ රු. මිලියන 868.3 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.මිලියන 837.37 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි.

### 2.3.1 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරිම

(අ) **i.** කොන්ඩච්චි කජු ව්‍යාපෘතිය යටතේ කජු වගා කර තිබුණු අක්කර 1,200 ක භූමිය අවශ්‍ය පරිදි බිම් සකස් කර ගැනීම සඳහා යන්ත්‍ර පැය 7,200 ක් යොදා ගැනීමට රු.31,644,000 ක් මුදලක් ඇස්තමේන්තු කර තිබුණි. නමුත් කාර්යය නිම වනවිට වැයකර තිබුණු පැය ප්‍රමාණය පැය 8,770 ක් වූ අතර,ඊටඅදාළ වියදම රු.38,324,900 ක් වී තිබුණි. ඒ අනුව මේ පිළිබඳ ඇස්තමේන්තු සාධාරණ ලෙස සකස් කර නොතිබීම හේතුවෙන් වැඩිපුර යන්ත්‍ර පැය 1,570 ක් සඳහා රු. 6,680,900 ක මුදලක් වැය කර තිබුණි. ගිවිසුම් ප්‍රකාරව ලඳුකැළෑ එළි පෙහෙළි කිරීම සහ අපද්‍රව්‍ය ඉවත් කිරීම 2017 මාර්තු 18 දිනට පෙර සිදුකල යුතු වුවත් එම කාර්යය 2017 සැප්තැම්බර් 11 දින නිම කර තිබුණි. මෙම ව්‍යාපෘතියේ නඩත්තු කටයුතු දෙපාර්තමේන්තුවේ බලකා භටයින් විසින් මිනිස් දින 238,068 ක් යොදා නිමකල යුතුව තිබුණු නමුත් එම කාර්යයන් නිසි පරිදි ඉටු නොවීම හේතුවෙන් යන්ත්‍ර උපයෝගී කර ගැනීමට සිදුවී තිබුණු බව නිරීක්ෂණය විය.

**ii.** මෙම කජු ව්‍යාපෘති භූමියේ ශුද්ධ පවිත්‍ර කිරීමේ කටයුතු වෙනුවෙන් සේවා සැපයුම්කරුවෙකු තෝරා ගැනීම සඳහා පිළියෙල කල ලංසු පිරිවිතරයන්ට අනුව ලංසුකරුවන් අදාළ ක්ෂේත්‍රයේ ව්‍යාපෘති සාර්ථක ලෙස ඉටු කිරීම පිළිබඳව පසුගිය වර්ෂ 05 කට අදාලව ඉටුකල ව්‍යාපෘති වාර්තා ඉදිරිපත් කල යුතු වුවත්, කිසිදු ලංසුකරුවකු විසින් එලෙස පසුගිය වර්ෂ 05 තුළ සාර්ථක ලෙස ව්‍යාපෘති ඉටුකල බවට වූ ව්‍යාපෘති වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

**(ආ)** 2017 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම අනුව හටයින් සඳහා නලා 21000 ක් මිල දී ගැනීමට රු.4,284,000 ක මුදලක් ඇස්තමේන්තු කර තිබුණු අතර, ඒ සඳහා රු.4,709,250 ක් වැයකර තිබුණි. අදාල ඇස්තමේන්තුව වැට් බදු නොසලකා සකස් කිරීම හේතුවෙන් ඇස්තමේන්තු මුදල ඉක්මවා රු.425,250 ක් වැය කර තිබුණි.

**2.4 අවිධිමත් ගනුදෙනු**

**---------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) විල්පත්තු බලකාය යටතේ පවත්වා ගෙන යනු ලබන ඇඟළුම් කම්හලේ සේවය කරන 85 දෙනෙකු සඳහා ආහාර දීමනා වශයෙන් 2017 ජනවාරි සිට 2017 අගෝස්තු දක්වා කාලය තුළ රාජකාරි සඳහා වාර්තා නොකළ මිනිස් දින 1609ක් වෙනුවෙන් නිලධාරීන්ට දිනකට රු. 250 බැගින් රු. 402,250 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) බක්කිඇල්ල උප බලකා මූලස්ථානයේ දේශනශාලාවක් ඉදිකිරීම සඳහා 2016ඔක්තෝබර් 06 දින නිලධාරියෙකු වෙත ලබාදුන් රු. 1,500,000 ක අත්තිකාරම් මුදල 2017 දෙසැම්බර් 31 දින වන තෙක් පියවා නොතිබුණි. මේ සම්බන්ධයෙන් අදාළ නිලධාරියා විසින් සිදු කරන ලද පැහැදිලි කිරීම අනුව එම අත්තිකාරම් මුදලින් රු. 1,374,000 ක මුදලක් ඉහළ තනතුරක නිලධාරියෙකු විසින් ලබා ගෙන තිබුණු අතර 2017 දෙසැම්බර් 31 දින වන තෙක් එම මුදල ආපසු පියවීමට කටයුතු කර නොතිබුණි. ගොඩනැගිල්ල ඉදිකිරීමට අවශ්‍ය ගොඩනැගිලි ද්‍රව්‍ය ප්‍රදේශයේ වෙළෙඳ ආයතනයකින් මිලදී ගත් බවට දක්වමින් රු 1,374,000 ක මුදල නිරවුල් කිරීමට හැකිවන පරිදි 2016 ඔක්තෝබර් 06 දින ගෙවීම් වවුචරයක් ඉදිරිපත් කර තිබුණු නමුත් අදාළ ගොඩනැගිලි ද්‍රව්‍ය බලකාය විසින් නොමිලේ සපයාගෙන තිබුණු බවත් නිරීක්ෂණය විය.

## 2.5 අනාර්ථික ගනුදෙනු

ප්‍රසම්පාදන සැලැස්ම අනුව 2017 වර්ෂයේ වැඩ ඇඳුම් (Black Over roll) 20,000 ක් සපයා ගැනීම වෙනුවෙන් රු.15,800,000 ක් දක්වා තිබුණද වර්ෂය තුළ අවස්ථා 02 කදී වැඩ ඇඳුම් මිල දී ගැනීම සඳහා රු.17,630,000 ක් වැය කර තිබුණි. ලැබී තිබුණු තොරතුරු අනුව වැඩ ඇඳුම් සහිතව රාජකාරී කරන භටයින් සඳහා වර්ෂයකට එක් වැඩ ඇඳුම් කට්ටලය බැගින් නිකුත් කරන බවත් හා එවැනි රාජකාරීන් කරන භටපිරිස 13,000 ක ප්‍රමාණයක් බවත් අනාවරණය විය. ඒ අනුව වැඩ ඇඳුම් 7,000 ක පමණ ප්‍රමාණයක් වැඩිපුර මිලදී ගැනීමට රු. 6,170, 500 ක මුදලක් වැයකර තිබුණි. වැඩ ඇඳුම්වල වාර්ෂික අවශ්‍යතාවය නිවැරදිව හඳුනා ගැනීමට ක්‍රමවේදයක් යොදා නොගැනීම මත අවශ්‍යතාවයට වැඩියෙන් මිලදී ගැනීම් සිදු වීමට හේතු වී තිබුණි. එසේම 2017 ජනවාරි 01 දින වන විට ගබඩාව තුළ තවත් එවැනි වැඩ ඇඳුම් 5,408 ක් ඉතිරිවී පැවති බවටද කරුණු නිරීක්ෂණය විය.

## 2.6 කාර්යභාරයන් ඉටු කිරිම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 10,685.38 | 10,683.91 | 1.47 | 0.01 |
| | මූලධන | 67.65 | 67.15 | 0.50 | 0.74 |
| | **එකතුව** | **10,753.03** | **10,751.06** | **1.97** | **0.01** |
| 2014 | පුනරාවර්තන | 12,030.20 | 12,029.31 | 0.89 | 0.01 |
| | මූලධන | 120.80 | 120.80 | - | - |
| | **එකතුව** | **12,151.00** | **12,150.11** | **0.89** | **-** |
| 2015 | පුනරාවර්තන | 17,289.92 | 17,114.02 | 175. 90 | 1.02 |
| | මූලධන | 188.00 | 187.37 | 0.63 | 0.33 |
| | **එකතුව** | **17,477.92** | **17,301.39** | **176.53** | **1.01** |
| 2016 | පුනරාවර්තන | 17,213.63 | 16,677.19 | 536.44 | 3.12 |
| | මූලධන | 318.06 | 310.47 | 7.59 | 2.38 |
| | **එකතුව** | **17,531.69** | **16,987.66** | **544.03** | **3.1** |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2017 | පුනරාවර්තන | 16,720.25 | 16,549.88 | 170.37 | 1.02 |
| | මුලධන | 280.70 | 235.70 | 45.00 | 16.03 |
| | **එකතුව** | **17,000.95** | **16,785.58** | **215.37** | **1.27** |

**(අ) විසර්ජන ගිණුම**

**සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම**

වැය විෂයයන් 01 ක් සඳහා සලසා තිබුණු රු. 830,960 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් කිසිදු උපයෝජනයක් නොකර මුළුමණින්ම ඉතිරි කර තිබුණි.

### 2.7 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට විෂය අංක 32001 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 500 | 496.22 | 300 | 302.09 | 1,000 | 272.11 |

**හිඟ හිටි ණය ශේෂ අයකර නොගැනීම**

විගණනයට ඉදිරිපත් කල සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව 2017 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හැර රු. 1,122,422 ක් විය.

### 2.8 පොදු තැන්පත් ගිණුම

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ තැන්පත් ගිණුම් 3 ක 2017 දෙසැම්බර් 31 දිනට පැවති ශේෂවල එකතුව රු.422,460,619 ක් විය. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු. 5,739,563 ක් වූ තැන්පතු 02 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් විවිධ කාර්යයන් සඳහා ලබාදී තිබුණු රු.5,688,563 ක මුදල් අදාළ කාර්යයභාරයන් ඉටු නොකර තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

## 2.9 මානව සම්පත් කළමනාකරණය

### 2.9.1 අනුයුක්ත කාර්ය මණ්ඩල, තථ්‍ය කාර්ය මණ්ඩල සහ පුද්ගල පඩිනඩි සඳහා වියදම්

2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 15,551 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.417,180 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 23 | 14 | 09 | - |
| (ii) | තෘතියික මට්ටම | 84 | 54 | 30 | - |
| (iii) | ද්විතියික මට්ටම | 26 | 17 | 09 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 40,460 | 37,189 | 3,271 | - |
| (v) | අනියම්/කොන්ත්‍රාත් | - | 02 | - | 02 |
| | | 40,593 | 37,276 | 3,319 | 02 |